සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 | S | I, II**

18682

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
## General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

**කතෝලික ධර්මය I, II**
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කතෝලික ධර්මය I

*උපදෙස්:*

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පුරාණ ගිවිසුමෙහි අඩංගු ගැලවීමේ ඉතිහාසයෙහි පරමාර්ථය
(1) මිනිසාගේ මැවීම විස්තර කිරීමයි.
(2) පාපයේ ආරම්භය විස්තර කිරීමයි.
(3) දේව විශ්වාසය වර්ධනය කිරීමයි.
(4) ජුදා ඉතිහාසය ලේඛනගත කිරීමයි.

**2.** ශුද්ධ වූ පාවුලුතුමන්ගේ ධර්මදූත සේවාව සඳහන්ව ඇති ග්‍රන්ථය වනුයේ
(1) එළිදරව් පොත ය. (2) ශුද්ධ වූ ලූක්තුමන්ගේ සුවිශේෂය ය.
(3) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ය. (4) ශුද්ධ වූ මතෙව්තුමන්ගේ සුවිශේෂය ය.

**3.** එළිදරව් සාහිත්‍යයේ ඉශ්‍රායෙල් ජනතාව සංකේතවත් කරන සංඛ්‍යාව වනුයේ,
(1) 12 ය. (2) 10 ය. (3) 8 ය. (4) 6 ය.

**4.** යහපත සහ අයහපත අතර වෙනස වෙන්කර හඳුනාගෙන යහපත ඉටුකිරීමට අපට අවශ්‍ය වනුයේ,
(1) ප්‍රඥාව ය. (2) දේවබය ය. (3) ඇනගැන්ම ය. (4) දේව භක්තිය ය.

**5.** මුල් කිතුනු සභාවේ සහනාධාර බෙදීම සඳහා පත්කරන ලද උපස්ථායකයින්ගේ එක් ගුණාංගයකි
(1) ක්‍රියාශීලී වීම. (2) ධනවත් වීම.
(3) නිරෝගීමත් වීම. (4) ප්‍රඥාවෙන් පූර්ණ වීම.

**6.** ජේසුස් වහන්සේගෙන් කැඳවීම ලැබීමට පෙර ශුද්ධ වූ පාවුලුතුමා ක්‍රිස්තු අනුගාමිකයන්ට පීඩා කළේ,
(1) එතුමා රෝම පුරවැසියකු නිසා ය.
(2) එතුමා ජුදා දහමට බෙහෙවින් ඇලුම් කළ නිසා ය.
(3) ඔවුන්ගේ ධනය ලබා ගැනීම සඳහා ය.
(4) ඔවුන් එකමුතුව ජීවත් වන බව දුටු නිසා ය.

**7.** "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය" යි ප්‍රකාශ කරන ලද්දේ,
(1) ශුද්ධ වූ පාවුලුතුමන් විසිනි.
(2) ශුද්ධ වූ ජොහන්තුමන් විසිනි.
(3) ශුද්ධ වූ පේදුරුතුමන් විසිනි.
(4) ශුද්ධ වූ ඇන්ඩෘතුමන් විසිනි.

[දෙවැනි පිටුව බලන්න.

**8.** පහත සඳහන් සිදුවීම් කෙරේ අවධානය යොමු කරන්න.

A - ධර්මදූත කටයුතු සඳහා ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු ලංකාවට පැමිණීම.

B - ජේසු නිකායික ධර්මදූතවරු ලංකාවට පැමිණීම.

C - සියලුම පාසල්වල රෙපරමාදු දහම පමණක් ඉගැන්වීම.

D - කිතුනුවන් මහනුවර රාජධානියට සංක්‍රමණය වීම.

E - ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් ලංකාවට පැමිණීම.

ඉහත සඳහන් සිදුවීම් අතරින් පෘතුගීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන සමයේ සිදුවූ ඇ දැක්වෙන වරණය කුමක් ද?

(1) A හා B (2) A හා E (3) B හා C (4) B හා D

**9.** ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර අප හා සදහට ම සිටීම පිණිස මහ බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කරන ලද ප්‍රසාද නිධානය

(1) බෞතීස්ම ස්නාපනය ය. (2) අභිවෘද්ධි ආලේපය ය.

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය. (4) සමගි සන්ධානය ය.

**10.** "මේ දවස නුඹලාට අනුස්මරණ දිනයක් ලෙස ද සමිඳාණන් වහන්සේ වන මා හට මංගලෝත්සව දිනයක් ලෙස ද පැවැත්විය යුතු ය." දෙවියන් වහන්සේ විසින් දෙන ලද මෙම නියෝගය සම්බන්ධ වනුයේ,

(1) සීනයි ගිවිසුමට ය. (2) පාස්කු මංගල්‍යයට ය.

(3) පෙන්තකොස්ත මංගල්‍යයට ය. (4) පොරොන්දු දේශයට ඇතුලුවීමට ය.

**11.** පුරාණ ගිවිසුමේ දවන යාග පැවැත්වීමේ පරමාර්ථයක් වූයේ

(1) පව්වලට සමාව ලබාගැනීම ය. (2) ලෙඩ රෝගවලින් මිදීම ය.

(3) සිතන පතන දේ ලබාගැනීම ය. (4) කල්වාරි යාගය පූර්ණත්වයට පත් කිරීම ය.

**12.** "මම පූජාවලට වඩා කරුණාවට කැමැත්තෙමි. ...." මෙසේ සඳහන් කර ඇති දිවැසිවරයා වන්නේ,

(1) එළියා ය. (2) ජෙරමියා ය. (3) හොසියා ය. (4) නාතාන් ය.

**13.** අප පවුල ජීවත්වන නිවස ශුද්ධ වූ ස්ථානයක් වනුයේ

(1) පවුල තුළ අප සතුටින් ජීවත්වන නිසා ය.

(2) සමාජයේ කුඩාම ඒකකය පවුල නිසා ය.

(3) පවුල අපේ අන්‍යෝන්‍ය රැඳියාවට රුකුලක් නිසා ය.

(4) ජේසුස් වහන්සේ උපත ලැබුවේ හා ජීවත්වූයේ පවුලක් තුළ නිසා ය.

**14.** අනුන් සතු දේ අයුතු ලෙස ලබාගැනීම හා ඒවාට ආශා කිරීම පාපී ක්‍රියාවක් වන්නේ එය කුමන පනතට විරුද්ධ නිසා ද?

(1) දෙවන පනත (2) හතරවන පනත (3) අටවන පනත (4) දසවන පනත

**15.** අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සඳහන් අනනියස් සහ සපිරා සිද්ධියෙන් පෙන්නුම් කරන්නේ

(1) තම වත්කම් ආරක්ෂා කළ යුතු බවයි.

(2) ඉඩම් විකිණීමේදී ප්‍රවේශම් විය යුතු බවයි.

(3) අන් අයගේ යහපත ගැන සතුටු විය යුතු බවයි.

(4) බොරු කරන අයට භයානක විනිශ්චයක් පැමිණෙන බවයි.

**16.** ජනවන්දනා පළමු වසර (A) තුළ ඉරු දින භාවිත කෙරෙන සුබාරංචිය

(1) ශුද්ධ වූ ලූක්තුමන්ගේ ය.

(2) ශුද්ධ වූ මතෙව්තුමන්ගේ ය.

(3) ශුද්ධ වූ මාර්ක්තුමන්ගේ ය.

(4) ශුද්ධ වූ ජොහන්තුමන්ගේ ය.

**17.** දිව්‍ය පූජාව සඳහා භාවිත කරන වර්ණ අතරින් 'බලාපොරොත්තුව, නව ජීවනය සහ වර්ධනය' යන අරුත ගෙනදෙන වර්ණය වනුයේ,

(1) දම් ය. (2) කොළ ය. (3) සුදු ය. (4) රතු ය.

[තුන්වැනි පිටුව බලන්න.

**18.** දේව වන්දනාවේ (ජන වන්දනාවේ) උතුම්ම පිළිවෙත වනුයේ,
(1) බයිබල් මෙහෙයයි. (2) දිව්‍ය පූජාවයි. (3) සුව මෙහෙයයි. (4) ශුද්ධ වූ පැයයි.

**19.** ඉතිහාසය පුරාවට සිදු වූ සභා බෙදීම්වලට බලපෑ පොදු සාධකය වූයේ,
(1) නායකත්වය සඳහා වූ තරගකාරීත්වයයි.
(2) විවිධ රටවල සභාව ව්‍යාප්ත වීමයි.
(3) එකිනෙක සභා නායකයින් අතර ඇති වූ ගැටලුකාරී තත්ත්වයයි.
(4) මනුෂ්‍යාගේ දුර්වලකම් සහ පව්කාරී ස්වභාවයයි.

**20.** "අබ්බා පියාණනී, ඔබට සියල්ලක්ම හැකි ය: මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා." ජේසුස් වහන්සේ විසින් මෙසේ පවසන ලද්දේ
(1) මල් උයනේ යාඥාවේදී ය.
(2) උත්තම පූජක යාඥාවේදී ය.
(3) ස්වර්ගයේ වැඩසිටින යාඥාවේදී ය.
(4) ලාසරස් මරණින් නැඟිටවීමට පෙර කළ යාඥාවේදී ය.

**21.** ඊසාක් පූජා කිරීමේ සිද්ධිය වාර්තා කර ඇත්තේ
(1) P සම්ප්‍රදායේ ය. (2) J සම්ප්‍රදායේ ය. (3) E සම්ප්‍රදායේ ය. (4) D සම්ප්‍රදායේ ය.

**22.** පූජක සම්ප්‍රදායට (P) අයත් ශුද්ධ බයිබලයේ සඳහන් සිද්ධි දෙකක් වන්නේ,
(1) මැවීම පිළිබඳ පළමු කතාව සහ ආදම් සහ ඒව පාපයට වැටීම ය.
(2) මැවීම පිළිබඳ දෙවන කතාව සහ නෝවා සමග ගිවිසුම ය.
(3) මැවීම පිළිබඳ පළමු කතාව සහ නෝවා සමග ගිවිසුම ය.
(4) මැවීම පිළිබඳ දෙවන කතාව සහ කායින් හා ආබෙල් පිළිබඳ කතාව ය.

**23.** එක් ගෝත්‍රයකින් හයදෙනා බැගින් ගෝත්‍ර 12න් විනයධරයන් 72ක් තෝරා ශුද්ධ බයිබලය ග්‍රීක භාෂාවට පරිවර්තනය කිරීමට පියවර ගත් රජතුමා
(1) පළමු ටොලමි ය. (2) දෙවන ටොලමි ය. (3) සයිරස් ය. (4) ජොෂියා ය.

**24.** බැබිලෝනීය විප්‍රවාසගත ජනතාව තුළ නව බලාපොරොත්තු ඇති කරමින් ඉශ්‍රායෙල් ජාතියේ නැවත හැරී ඒම පිළිබඳව විශ්වාසයෙන් කථාකළ දිවැසිවරයෙකි
(1) යෙසායා. (2) ජෙරමියා. (3) ජෝවෙල්. (4) එසකියෙල්.

**25.** දේශක දිවැසිවරුන්ගේ වචන සහ ක්‍රියා අඩංගු නිවැරදි පොත් කාණ්ඩ වන්නේ,
(1) 1, 2 සාමුවෙල් සහ 1, 2 වංශාවලිය ය.
(2) 1, 2 රාජාවලිය සහ 1, 2 වංශාවලිය ය.
(3) 1, 2 වංශාවලිය සහ 1, 2 මකබී ය.
(4) 1, 2 සාමුවෙල් සහ 1, 2 රාජාවලිය ය.

**26.** සමිඳාණන්ගේ හඬට පිළිතුරුදෙමින් "මෙන්න මම මෙහිය, මා යැව්ව මැනව" ලෙස පැවසූ දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා ය. (2) ජෙරමියා ය. (3) එසකියෙල් ය. (4) ජෝවෙල් ය.

**27.** කුරුසියේ මාර්ගය තුළින් පමණක් ජයග්‍රාහී උත්ථානයට පංගුකාර විය හැකි බව අවධාරණය කරන සුවිශේෂකවරයා වන්නේ,
(1) ශුද්ධ වූ මතෙව්තුමා ය. (2) ශුද්ධ වූ මාක්තුමා ය.
(3) ශුද්ධ වූ ජොහන්තුමා ය. (4) ශුද්ධ වූ පාවුලුතුමා ය.

**28.** උත්පත්ති පොතේ 3: 17-19ට අනුව දෙවියන් වහන්සේ "පොළවට සාපවේවා!" යැයි දඬුවම් කළේ,
(1) ආදම්ට ය. (2) ඒවට ය. (3) සර්පයාට ය. (4) කායින්ට ය.

**29.** 'ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි.' මෙසේ සඳහන් කරන්නේ,
(1) ශුද්ධ වූ ජොහන්තුමන්ගේ සුවිශේෂයේ ය. (2) ශුද්ධ වූ ජාකොබ්තුමන්ගේ ලිපියේ ය.
(3) ශුද්ධ වූ ලූක්තුමන්ගේ සුවිශේෂයේ ය. (4) ශුද්ධ වූ ජුද්තුමන්ගේ ලිපියේ ය.

[හතරවැනි පිටුව බලන්න.

18682

**30.** දෙවියන් වහන්සේ ආදි මව්පියන් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමට පසුබිම වූයේ,
(1) කායින් විසින් ආබෙල්ව මරනු ලැබීම ය. (2) දේව සැලැස්ම වෙනස් කිරීම ය.
(3) ඔවුන් දේව හඬට අකීකරු වීම ය. (4) ඔවුන්ට දඬුවම් කිරීම ය.

**31.** "මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මම එවන්නෙමි." පුරාණ ගිවිසුමේ මෙසේ සඳහන් කළ දිවැසිවරයා වන්නේ,
(1) ජෝවෙල් ය. (2) යෙසායා ය. (3) එසකියෙල් ය. (4) මලාකි ය.

**32.** දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැති බව සනාථ කරන නව ගිවිසුමේ එක් අවස්ථාවක් වනුයේ,
(1) එලිසබෙත්තුමිය ඇගේ මහලුවියේ දරුවකු පිළිසිඳ ගැනීම ය.
(2) ජේසුස් වහන්සේ ජෝර්දාන් නදියේ බෞතීස්මය ලැබීම ය.
(3) ස්නාවක ජොහන්තුමා ජේසුස් වහන්සේගේ පෙරමඟ සැලසීම ය.
(4) අවසාන විනිශ්චය සඳහා ජනතාව සූදානම් කිරීම ය.

**33.** අප ජීවිතය තුළ දෙවිඳුන්ට හිමි තැන ධනයටවත් බලයටවත් ලබා නොදිය යුතු බවට ලැබෙන පණිවිඩය ගැබ් වී ඇත්තේ
(1) ජේසුස් වහන්සේ මුහුණ දුන් පළමු පරීක්ෂාවේ ය.
(2) ජේසුස් වහන්සේ මුහුණ දුන් දෙවන පරීක්ෂාවේ ය.
(3) ජේසුස් වහන්සේ විසින් පූප වැඩි කළ අවස්ථාවේ ය.
(4) ජේසුස් වහන්සේව ජනතාව රජ කෙනෙකු කිරීමට තැත්කළ අවස්ථාවේ ය.

**34.** ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය තුළින් කුමක් උදාවූ බව උන්වහන්සේ සනාථ කළේ ද?
(1) දේව රාජ්‍යය (2) දේව ආඥාව (3) දේව උදහස (4) දේව නීතිය

**35.** ජේසුස් වහන්සේ තමන් යාමට අදහස් කළ නගර සහ පෙදෙස්වලට තම ශ්‍රාවකයන් දෙදෙනා බැගින් ධර්මදූත සේවයට යැවූ බව වාර්තාකරන සුවිශේෂකවරයා වන්නේ
(1) ශුද්ධ වූ මතෙව්තුමා ය. (2) ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ මාක්තුමා ය. (4) ශුද්ධ වූ ජොහන්තුමා ය.

**36.** මනුෂ්‍ය උතුම්කම නැවත පිහිටුවීමක් සිදුකරන දේවප්‍රසාද නිධානය වනුයේ,
(1) ආශිර්වාදකාර බන්ධනයයි. (2) අභිවෘද්ධි ආලේපයයි.
(3) රෝගීන් ආලේපයයි. (4) සමගි සන්ධානයයි.

**37.** තේවාචාරීන්ගේ ජනවන්දනාමය වගකීමකි
(1) ජනතාවට සැබෑ එඬේරෙකු වීම. (2) පූජකතුමන්ලා නඩත්තු කිරීම.
(3) විවාහ පිළිවෙත් සිදුකිරීම. (4) ව්‍යවස්ථාවක් අනුගමනය කරමින් ජීවත් වීම.

**38.** පැවිදි ජීවිතයේ ලක්ෂණයක් වන්නේ,
(1) සාංඝික ජීවිතයයි. (2) පක්ෂ දේශපාලනයයි.
(3) තනි තීරණ ගැනීමයි. (4) රාජ්‍ය සේවයේ යෙදීමයි.

**39.** "කතෝලික දහම් පාසල කිතුනුවාට පොදු පූජකවරය තුළින් ලැබෙන දිවැසිවර කාර්යයෙහි නියුතුවීමට හොඳ තෝතැන්නකි." මෙසේ සඳහන් වන්නේ,
(1) සභා නීතියේ ය. (2) කතෝලික සභා ධර්මෝපදේශයේ ය.
(3) කොරින්තිවරුන්ට ලියූ ලිපියේ ය. (4) එපීසවරුන්ට ලියූ ලිපියේ ය.

**40.** ජනවාරි පළමුවන දින පවත්වනු ලබන දේවමාතාවන්ගේ මංගල්‍යය වනුයේ,
(1) මරියතුමියගේ උපන් මංගල්‍යය ය.
(2) මරියතුමියගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය ය.
(3) පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය ය.
(4) ලංකා අප ස්වාමිදූගේ මංගල්‍යය ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)**
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

**කතෝලික ධර්මය I, II**
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) පේදුරුතුමන්ගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණු **දෙකක්** ලියන්න.

(ii) ජේසුස් වහන්සේ පස්වන පනතට දුන් නව අර්ථකථනයේ අඩංගු කරුණු **දෙකක්** ලියන්න.

(iii) ශුද්ධ වූ සභාවේ කතෝලිකත්වය දෙයාකාර ය. ඒවා කෙටියෙන් විස්තර කරන්න.

(iv) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් **දෙකක්** ලියන්න.

(v) බලාපොරොත්තුවට විරුද්ධ පාප **දෙක** නම් කරන්න.

(vi) රුචියට වහල් වී ඒව ගත් වැරදි තීරණයෙන් අපට ලැබෙන පණිවුඩ **දෙකක්** ලියන්න.

(vii) සුවිශේෂක ශුද්ධ වූ ලූක්තුමා තුළ තිබූ සුවිශේෂ දක්ෂතා **දෙකක්** ලියන්න.

(viii) දේව රාජ්‍යයේ වටිනාකම් පෙන්වා දීමට ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා **දෙකක්** නම් කරන්න.

(ix) ප්‍රසාද ස්නාපනයේදී භාවිත කරන පාස්කු ඉටිපහන මගින් සංකේතවත් වන කරුණු **දෙකක්** ලියන්න.

(x) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන නම් කර, එයින් සිදුවන සේවාවන් **දෙකක්** ලියන්න.

**2.** (i) ශුද්ධ වූ පාවුලුතුමන් විසින් ලිපි ලිවීමේ පරමාර්ථ **දෙකක්** ලියන්න.

(ii) ශුද්ධ වූ පාවුලුතුමන්ගේ ආරුඪ කතෘත්වය යටතේ ලියන ලද හසුන් **තුනක්** නම් කරන්න.

(iii) ශුද්ධ වූ පාවුලුතුමා තම ජීවිතය අවසාන කාලයේදී මුහුණ දුන් ප්‍රශ්න **දෙකක්** සඳහන් කර, වත්මන් සමාජය තුළ පැනනගින ප්‍රශ්න හමුවේ ඔබ ද ශුද්ධ වූ පාවුලුතුමන් මෙන් කටයුතු කරන ආකාරය කරුණු **තුනකින්** විස්තර කරන්න.

**3.** (i) ඉශ්‍රායෙල්වරුන් වහලුන් ලෙස මිසරයේ සිටියදී ඔවුන්ගෙන් ලබාගන්නා ලද වහල් වැඩ **දෙකක්** ලියන්න.

(ii) පාස්කු බැටලුවා අනුභව කිරීම හා සම්බන්ධව දෙන ලද උපදෙස් **තුනක්** ලියන්න.

(iii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ඔබ සූදානම් වන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

**4.** (i) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුණිතුමන්ගෙන් අපට ලබාගත හැකි ආදර්ශ **දෙකක්** ලියන්න.

(ii) කල්කටාවේ ශුද්ධ වූ තෙරේසා මව්තුමිය අතින් සිදු වූ සේවාවන් **තුනක්** ලියන්න.

(iii) ඔබ ප්‍රදේශයේ දුගී දුප්පත් ජනයා නඟා සිටුවීමට ඔබට කළහැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**5.** (i) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) දිවැස්වැකි කීමේදී භාවිත කළ තුන් ආකාර පද මාලාවන් නම් කරන්න.

(iii) ජෙරමියා දිවැසිවරයාගේ කැඳවීම තුළ අපේ ජීවිතයට ගතහැකි මඟපෙන්වීම් **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**6.** (i) කතෝලික විවාහයේ පරමාර්ථ **දෙක** සඳහන් කරන්න.

(ii) කතෝලික විවාහයට ඇති නීත්‍යානුකූල බාධා **තුනක්** ලියන්න.

(iii) ''කතෝලික විවාහ ජීවිතය සාර්ථක කර ගනිමු.'' යන ශීර්ෂය යටතේ පිළියෙල කරන ලිපියකට අඩංගු විය යුතු මූලික කරුණු **පහක්** ලියන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ජේසුස් වහන්සේ ශුද්ධ වූ තෝමස්තුමාට දර්ශනය වීම

(ii) ශුද්ධ වූ මරිය ගොරෙත්තිතුමිය

(iii) ඉරුදිනත් ණය මංගල්ලය දිනත් මුළු දිව්‍ය පූජාවට සහභාගිවීම

(iv) මරියතුමිය ශුද්ධ වූ සභාවේ මාතාවයි

❊ ❊ ❊

iruonline.com